(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 58. ]

# පාර්ලිමේන්තුවේ කාර්ය සටහන්

**2021 මාර්තු 09 අඟහරුවාදා පූ. භා. 10.00 ට**

## පැමිණි මන්ත්‍රීන් :

ගරු **මහින්ද යාපා අබේවර්ධන මහතා,** කථානායකතුමා

ගරු **රංජිත් සියඹලාපිටිය මහතා,** නියෝජ්‍ය කථානායකතුමා සහ කාරක සභා සභාපතිතුමා

ගරු **අංගජන් රාමනාදන් මහතා,** නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමා

---

ගරු **මහින්ද රාජපක්ෂ මහතා,** අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමා

ගරු **මහින්ද අමරවීර මහතා,** පරිසර අමාත්‍යතුමා

ගරු **ඩලස් අලහප්පෙරුම මහතා,** විදුලිබල අමාත්‍යතුමා

ගරු **මහින්දානන්ද අලුත්ගමගේ මහතා,** කෘෂිකර්ම අමාත්‍යතුමා

ගරු **දිනේෂ් ගුණවර්ධන මහතා,** විදේශ අමාත්‍යතුමා සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා

ගරු **(ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා,** වෙළඳ අමාත්‍යතුමා

ගරු **එස්. එම්. චන්ද්‍රසේන මහතා,** ඉඩම් අමාත්‍යතුමා

ගරු **නිමල් සිරිපාල ද සිල්වා මහතා,** කම්කරු අමාත්‍යතුමා

ගරු **ඩග්ලස් දේවානන්දා මහතා,** ධීවර අමාත්‍යතුමා

ගරු **වාසුදේව නානායක්කාර මහතා,** ජල සම්පාදන අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා,** වැවිලි අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) ජී. එල්. පීරිස් මහතා,** අධ්‍යාපන අමාත්‍යතුමා

ගරු **ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා,** මහාමාර්ග අමාත්‍යතුමා සහ ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකතුමා

ගරු **ප්‍රසන්න රණතුංග මහතා,** සංචාරක අමාත්‍යතුමා

ගරු **සී. බී. රත්නායක මහතා,** වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමා

ගරු **චමල් රාජපක්ෂ මහතා,** වාරිමාර්ග අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යතුමා සහ ස්වදේශ කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ගාමිණී ලොකුගේ මහතා,** ප්‍රවාහන අමාත්‍යතුමා

ගරු **පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය,** සෞඛ්‍ය අමාත්‍යතුමිය

ගරු **(ආචාර්ය) සරත් වීරසේකර මහතා,** මහජන ආරක්ෂක අමාත්‍යතුමා

ගරු **එම්. යූ. එම්. අලි සබ්රි මහතා,** අධිකරණ අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සීතා අරඹේපොල මහත්මිය,** නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යතුමිය

ගරු **ලසන්ත අලගියවන්න මහතා,** සමුපකාර සේවා, අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අජිත් නිවාඩ් කබ්රාල් මහතා,** මුදල් හා ප්‍රාග්ධන වෙළෙඳපළ සහ රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිරිපාල ගමලත් මහතා,** මහවැලි කලාප ආශ්‍රිත ඇලවේලි හා ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(ආචාර්ය) නාලක ගොඩහේවා මහතා,** නාගරික සංවර්ධන, වෙරළ සංරක්ෂණ, අපද්‍රව්‍ය බැහැරලීම හා ප්‍රජා පවිත්‍රතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සිසිර ජයකොඩි මහතා,** දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අනුරාධ ජයරත්න මහතා,** ග්‍රාමීය කුඹුරු හා ආශ්‍රිත වැව්, ජලාශ හා වාරිමාර්ග සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියංකර ජයරත්න මහතා,** විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළෙඳපළ විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(මහාචාර්ය) චන්න ජයසුමන මහතා,** ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දයාසිරි ජයසේකර මහතා,** බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **පියල් නිශාන්ත ද සිල්වා මහතා,** කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා,** පොහොර නිෂ්පාදන හා සැපයුම්, රසායනික පොහොර හා කෘමිනාශක භාවිත නියාමන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **දුමින්ද දිසානායක මහතා,** සූර්යබල, සුළං හා ජල විදුලි ජනන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විමලවීර දිසානායක මහතා,** වනජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුළු ආරක්ෂිත වැඩ පිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **සනත් නිශාන්ත මහතා,** ග්‍රාමීය හා ප්‍රාදේශීය පානීය ජලසම්පාදන ව්‍යාපෘති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **අරුන්දික ප්‍රනාන්දු මහතා,** පොල්, කිතුල් හා තල් වගා ප්‍රවර්ධනය හා ආශ්‍රිත කාර්මික භාණ්ඩ නිෂ්පාදන හා අපනයන විවිධාංගීකරණ රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **(වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මිය,** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **සුසිල් ප්‍රේමජයන්ත මහතා,** අධ්‍යාපන ප්‍රතිසංස්කරණ, විවෘත විශ්වවිද්‍යාල හා දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **තාරක බාලසූරිය මහතා,** කලාපීය සහයෝගිතා කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විජිත බේරුගොඩ මහතා,** දහම් පාසැල්, පිරිවෙන් හා භික්ෂු අධ්‍යාපන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ප්‍රසන්න රණවීර මහතා,** වේවැල්, පිත්තල, මැටි, ලී බඩු සහ ග්‍රාමීය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **රොෂාන් රණසිංහ මහතා,** පළාත් සභා හා පළාත් පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ලොහාන් රත්වත්තේ මහතා,** මැණික් හා ස්වර්ණාභරණ ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා සහ බන්ධනාගාර කළමනාකරණ හා සිරකරුවන් පුනරුත්ථාපන කටයුතු රාජ්‍ය අමාත්‍ය

ගරු **නිමල් ලාන්සා මහතා,** ග්‍රාමීය මාර්ග හා අවශේෂ යටිතල පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජානක වක්කුඹුර මහතා,** උක්, බඩ ඉරිඟු, කජු, ගම්මිරිස්, කුරුඳු, කරාබුනැටි, බුලත් ඇතුළු කුඩා වැවිලි භෝග වගා සංවර්ධනය, ආශ්‍රිත කර්මාන්ත හා අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **විදුර වික්‍රමනායක මහතා,** ජාතික උරුම, ප්‍රාසාංග කලා හා ග්‍රාමීය කලා ශිල්පී ප්‍රවර්ධන කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කංචන විජේසේකර මහතා,** විසිතුරු මසුන්, මිරිදිය මත්ස්‍ය හා ඉස්සන් ඇති කිරීම, ධීවර වරාය සංවර්ධන, බහුදින ධීවර කටයුතු හා මත්ස්‍ය අපනයන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **එස්. වියාලේන්ද්‍රන් මහතා,** පසුගාමී ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධන සහ ගෘහාශ්‍රිත සත්ත්ව පාලන හා සුළු ආර්ථික භෝග වගා ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ජයන්ත සමරවීර මහතා,** ගුදම් පහසුකම්, බහාලුම් අංගන, වරාය සැපයුම් පහසුකම් හා බෝට්ටු හා නැව් කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ශෙහාන් සේමසිංහ මහතා,** සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඉන්දික අනුරුද්ධ හේරත් මහතා,** ග්‍රාමීය නිවාස හා ඉදිකිරීම් හා ගොඩනැගිලි ද්‍රව්‍ය කර්මාන්ත ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **කනක හේරත් මහතා,** සමාගම් වතු ප්‍රතිසංස්කරණ, තේ හා රබර් ආශ්‍රිත භෝග වගා සහ කර්මාන්තශාලා නවීකරණය හා තේ හා රබර් අපනයන ප්‍රවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා

ගරු **ඩී. බී. හේරත් මහතා,** පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන හා කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යතුමා

---

ගරු **අමරකීර්ති අතුකෝරළ මහතා**

ගරු **තලතා අතුකෝරල මහත්මිය**

ගරු **සම්පත් අතුකෝරල මහතා**

ගරු **තිස්ස අත්තනායක මහතා**

ගරු **හෙක්ටර් අප්පුහාමි මහතා**

ගරු **අශෝක් අබේසිංහ මහතා**

ගරු **(ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය**

ගරු **තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**

ගරු මායාදුන්න චින්තක අමල් මහතා

ගරු තවරාජා කලෙයි අරසන් මහතා

ගරු ජේ. සී. අලවතුවල මහතා

ගරු නසීර් අහමඩ් මහතා

ගරු තිසකුට්ටි ආරච්චි මහතා

ගරු එම්. උදයකුමාර් මහතා

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා

ගරු (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා

ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු අකිල එල්ලාවල මහතා

ගරු ලලිත් එල්ලාවල මහතා

ගරු සෙල්වරාජා කජේන්ද්‍රන් මහතා

ගරු ගෝවින්දන් කරුණාකරම් මහතා

ගරු ගයන්ත කරුණාතිලක මහතා

ගරු සාගර කාරියවසම් මහතා

ගරු ෆයිසාල් කාසිම් මහතා

ගරු ජයන්ත කැටගොඩ මහතා

ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා

ගරු උදයන කිරිඳිගොඩ මහතා

ගරු ජගත් කුමාර මහතා

ගරු ගෙවිඳු කුමාරතුංග මහතා

ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා

ගරු අ. අරවින්ද් කුමාර් මහතා

ගරු වේලු කුමාර් මහතා

ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා

ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා

ගරු ඩයනා ගමගේ මහත්මිය

ගරු (වෛද්‍ය) උපුල් ගලප්පත්ති මහතා

ගරු උදයකාන්ත ගුණතිලක මහතා

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය

ගරු යදාමිණී ගුණවර්ධන මහතා

ගරු සිවනේසතුරෙයි චන්ද්‍රකාන්තන් මහතා

ගරු මිලාන් ජයතිලක මහතා

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා

ගරු ප්‍රේමලාල් ජයසේකර මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා

ගරු එම්. එස්. තවුෆික් මහතා

ගරු ෂාන් විජයලාල් ද සිල්වා මහතා

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා

ගරු චාමර සම්පත් දසනායක මහතා

ගරු අනුර දිසානායක මහතා

ගරු මංජුලා දිසානායක මහත්මිය

ගරු මයන්ත දිසානායක මහතා

ගරු රෝහණ දිසානායක මහතා

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා

ගරු ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

ගරු ඩබ්ලිව්. එච්. එම්. ධර්මසේන මහතා

ගරු එච්. නන්දසේන මහතා

ගරු ගයාෂාන් නවනන්ද මහතා

ගරු අසංක නවරත්න මහතා

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා

ගරු කිංස් නෙල්සන් මහතා

ගරු බුද්ධික පතිරණ මහතා

ගරු අනුප පස්කුවල් මහතා

ගරු නිමල් පියතිස්ස මහතා

ගරු ජගත් පුෂ්පකුමාර මහතා

ගරු ඩිලාන් පෙරේරා මහතා

ගරු නිරෝෂන් පෙරේරා මහතා

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා

ගරු ජී. ජී. පොන්නම්බලම් මහතා

ගරු නලින් ප්‍රනාන්දු මහතා

ගරු හරීන් ප්‍රනාන්දු මහතා

ගරු අශෝක ප්‍රියන්ත මහතා

ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය

ගරු සජිත් ප්‍රේමදාස මහතා, පාර්ලිමේන්තුවේ විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා

ගරු උද්දික ප්‍රේමරත්න මහතා

ගරු ආර්. එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

ගරු රෝහණ බංඩාර මහතා

ගරු ශාන්ත බණ්ඩාර මහතා

ගරු රිසාඩ් බදියුදීන් මහතා

ගරු සුදත් මංජුල මහතා

ගරු එස්. එම්. මරික්කාර් මහතා

ගරු කේ. කාදර් මස්තාන් මහතා

ගරු ඉම්රාන් මහරූෆ් මහතා

ගරු ඉම්තියාස් බාකීර් මාකාර් මහතා

ගරු එස්. එම්. එම්. මුෂාරෆ් මහතා

ගරු මොහමඩ් මුසම්මිල් මහතා

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා

ගරු නිපුණ රණවක මහතා

ගරු බී. වයි. ජී. රත්නසේකර මහතා

ගරු (පූජ්‍ය) අතුරලියේ රතන හිමි

ගරු කුමාරසිරි රත්නායක මහතා

ගරු අලි සබ්රි රහීම් මහතා

ගරු ඉෂාක් රහුමාන් මහතා

ගරු මුජිබුර් රහුමාන් මහතා

ගරු (ආචාර්ය) සුරේන් රාඝවන් මහතා

ගරු හර්ෂණ රාජකරුණා මහතා

ගරු අජිත් රාජපක්ෂ මහතා

ගරු ගුණතිලක රාජපක්ෂ මහතා

ගරු (වෛද්‍ය) තිලක් රාජපක්ෂ මහතා

ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා

ගරු එම්. රාමේෂ්වරන් මහතා

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා

ගරු වරුණ ලියනගේ මහතා

ගරු ගාමිණී වලේබොඩ මහතා

ගරු ඉරාන් වික්‍රමරත්න මහතා

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය

ගරු චමින්ද විජේසිරි මහතා

ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා

ගරු මධුර විතානගේ මහතා

ගරු හේෂා විතානගේ මහතා

ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා

ගරු චන්දිම වීරක්කොඩි මහතා

ගරු (ජනාධිපති නීතිඥ) ජයන්ත වීරසිංහ මහතා

ගරු ඩී. වීරසිංහ මහතා

ගරු වීරසුමන වීරසිංහ මහතා

ගරු කුමාර වෙල්ගම මහතා

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා

ගරු රාජවරෝදයම් සම්පන්දන් මහතා

ගරු මෛත්‍රීපාල සිරිසේන මහතා

ගරු එම්. ඒ. සුමන්තිරන් මහතා

ගරු වඩිවේල් සුරේෂ් මහතා

ගරු (වෛද්‍ය) රාජිත සේනාරත්න මහතා

ගරු රවුෆ් හකීම් මහතා

ගරු එච්. එම්. එම්. හරීස් මහතා

ගරු (මහාචාර්ය) චරිත හේරත් මහතා

ගරු ජයරත්න හේරත් මහතා

ගරු විජිත හේරත් මහතා

ගරු සමන්ප්‍රිය හේරත් මහතා

ගරු මර්ජාන් ෆලීල් මහතා

ගරු ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා මහතා

ධම්මික දසනායක මහතා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්

කුෂානි රෝහණදීර මහත්මිය, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ පාර්ලිමේන්තුවේ නියෝජ්‍ය මහ ලේකම්

ටිකිරි කේ. ජයතිලක මහතා, සහකාර මහ ලේකම්

**කල් තැබීම අනුව පාර්ලිමේන්තුව රැස්විය. කථානායකවරයා මූලාසනාරූඪ විය.**

**1. ලිපිලේඛනාදිය පිළිගැන්වීම :** (1) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XVII, XVIII, XIX, XX සහ XXI කොටස් ද, සිව්වැනි කාණ්ඩයේ VIII කොටස සහ හයවැනි කාණ්ඩයේ XVII, XVIII හා XIX කොටස් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තිබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(2) කථානායකවරයා විසින් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව—

(i) බලපත්‍රලත් මත්පැන් නිෂ්පාදනාගාර පිළිබඳ සුරාබදු දෙපාර්තමේන්තුවේ නියාමනයේ ඇති කාර්යක්ෂමතාව ඇගයීම පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ අටවැනි කාණ්ඩයේ XXIII කොටස;

(ii) එළවළු බීජ දේශීය වශයෙන් නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලියේ කාර්ය සාධනය පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ අටවැනි කාණ්ඩයේ XXIV කොටස; සහ

(iii) මනම්පිටිය වැලි කැණීමේ ව්‍යාපෘතිය සම්බන්ධ විශේෂ විගණන වාර්තාව පිළිබඳ විශේෂ විගණන වාර්තාවේ දහවැනි කාණ්ඩයේ I කොටස

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තිබිය යුතු යැයි ද මුද්‍රණය කළ යුතු යැයි ද නියෝග කරන ලදී.

(3) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 2019 වර්ෂය සඳහා ශ්‍රී ලංකා නාවික හමුදාවේ වාර්ෂික කාර්ය සාධන වාර්තාව; සහ

(ii) 1979 අංක 61 දරන අත්‍යාවශ්‍ය මහජන සේවා පනතේ 2 වගන්තිය ප්‍රකාරව ජනාධිපතිවරයා වෙත පැවරී ඇති බලතල අනුව, 2021 මාර්තු 01 දිනැති අංක 2217/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ හා එහි උපලේඛනයෙහි පළ කරමින් කරන ලද ප්‍රකාශනය

ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව සහ ලේඛනය, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(4) මහාමාර්ග අමාත්‍යවරයා විසින් රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද වාර්තාවේ රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය සම්බන්ධ කරුණු පිළිබඳ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 119(4) ප්‍රකාරව නිරීක්ෂණ සහ ගනු ලැබූ ක්‍රියාමාර්ග පිළිබඳ වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(5) මහාමාර්ග අමාත්‍යවරයා විසින්—

(i) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 14 දිනැති අංක 2206/5 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි; සහ

(ii) 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1), 6 සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 දෙසැම්බර් 24 දිනැති අංක 2207/15 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද රෙගුලාසි

පිළිගන්වා එම රෙගුලාසි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(6) විදේශ අමාත්‍යවරයා විසින්—

(i) 2015 ජනවාරි 08 දිනෙන් ආරම්භ වී 2019 නොවැම්බර් 16 දිනෙන් අවසන් වූ කාල සීමාව තුළ නිලතල දැරූ රජයේ නිලධරයන්, රාජ්‍ය සංස්ථාවල සේවකයන්, සන්නද්ධ හමුදාවන්හි සහ පොලිස් සේවයෙහි සාමාජිකයන්ට සිදුවී ඇතැයි කියන දේශපාලනමය පළිගැනීම් පිළිබඳ පරීක්ෂා කර තොරතුරු ලබා ගැනීම සඳහා වන ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා අවසන් වාර්තාවේ පළමුවැනි, දෙවැනි සහ තෙවැනි වෙළුම්; සහ

(ii) 2015.01.15 දින සිට 2018.12.31 දක්වා කාලය තුළ රජයේ ආයතනවල සිදුවී ඇතැයි සැලකෙන දූෂණ වංචා පිළිබඳ සොයා බැලීමේ ජනාධිපති පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාව

සභාවේ විශේෂ අවසරය ඇතිව සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කරන ලදී.

එම වාර්තා, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(7) අධ්‍යාපන අමාත්‍යවරයා විසින් —

(i) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ ඉන්ටර්නැෂනල් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි ලිමිටඩ් විසින් ප්‍රදානය කරන ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 සැප්තැම්බර් 25 දිනැති අංක 2194/72 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(ii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ කාට්සු - හයිලි ඇඩ්වාන්ස් මෙඩිකල් ටෙක්නොලොජි ට්‍රේනින් සෙන්ටර් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රදානය කරන හෙද පිළිබඳ දර්ශනපති උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 ඔක්තෝබර් 07 දිනැති අංක 2196/40 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ බෙනඩික්ට් XVI කැතලික් ඉන්ස්ටිටියුට් ඔෆ් හයර් එඩියුකේෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රදානය කරන ව්‍යාපාර කළමනාකරණවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 නොවැම්බර් 09 දිනැති අංක 2201/4 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(iv) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ සිනෙක් කැම්පස් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රදානය කරන අධ්‍යයන ක්‍රියාකාරකම් මඟින් වන ව්‍යාපාර කළමනාකරණපති උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 දෙසැම්බර් 28 දිනැති අංක 2208/1 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(v) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ රෝයල් ඉන්ස්ටිටියුට් කලම්බු (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රදානය කරන අන්තර්ජාතික ආර්ථික විද්‍යාව හා මූල්‍ය පිළිබඳ ව්‍යාපාරවේදී (ගෞරව) උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජනවාරි 01 දිනැති අංක 2208/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය;

(vi) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ බිස්නස් මැනේජ්මන්ට් ස්කූල් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රදානය කරන ව්‍යාපාර කළමනාකරණවේදී (ගෞරව) උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජනවාරි 01 දිනැති අංක 2208/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය; සහ

(vii) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 25අ වගන්තිය යටතේ හොරයිසන් කොලේජ් ඔෆ් බිස්නස් ඇන්ඩ් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් ප්‍රදානය කරන ජෛව තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය සම්බන්ධයෙන් අධ්‍යාපන අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2021 ජනවාරි 01 දිනැති අංක 2208/49 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය

පිළිගන්වන ලදී.

එම නියෝග සහ නියමයන්, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

(8) වෙළඳ අමාත්‍යවරයා විසින් 2016 වර්ෂය සඳහා සමුපකාර තොග වෙළඳ සංස්ථාවේ වාර්ෂික වාර්තාව සහ ගිණුම් ඉදිරිපත් කර එම වාර්තාව, වෙළඳ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(9) වෙළඳ අමාත්‍යවරයා විසින් 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/6 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග ඉදිරිපත් කර එම ලේඛනය, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(10) මහාමාර්ග අමාත්‍යවරයා විසින් 2018 වර්ෂය සඳහා පොල් වගාකිරීමේ මණ්ඩලයේ වාර්ෂික වාර්තාව ඉදිරිපත් කර එම වාර්තාව, වැවිලි කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව වෙත යොමු කළ යුතු යැයි යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(11) අධිකරණ අමාත්‍යවරයා විසින් 2019 වර්ෂය සඳහා ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

**2. කාරක සභා වාර්තා පිළිගැන්වීම:** රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා විසින් එම කාරක සභාව වෙත යොමු කරන ලද—

(i) 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි;

(ii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නියෝග; සහ

(iii) 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති (සංශෝධන) පනත යටතේ නියමයන්

සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව, **සභා මේසය** මත තිබිය යුතු යැයි නියෝග කරන ලදී.

**3. මහජන පෙත්සම් පිළිගැන්වීම:**

(1) නුවරඑළිය, බඹරකැලේ, පියතිස්සපුර, අංක 1/24 දරන ස්ථානයෙහි පදිංචි ඒ. ආර්. එම්. අබේරත්න මහතාගෙන් ලැබුණු 2020.11.16 දිනැති පෙත්සම ගරු සී. බී. රත්නායක මහතා විසින් පිළිගන්වන ලදී.

(2) (i) කොළඹ 10, මරදාන, ෆෝබ්ස් පාර, අංක බී1/ජී2 දරන ස්ථානයෙහි පදිංචි එම්. ඒ. එන්. බණ්ඩාර මහතාගෙන් ලැබුණු 2021.01.03 දිනැති පෙත්සම; සහ

(ii) නුගේගොඩ, කෝට්ටේ පාර, අංක 347/1A දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. සිරිසේන පෙරේරා මහතාගෙන් ලැබුණු 2021.01.21 දිනැති පෙත්සම

ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා විසින් පිළිගන්වන ලදී.

(3) (i) හෝමාගම, පිටිපන දකුණ, වෙන්දේසිවත්ත, අංක 516/5 දරන ස්ථානයෙහි පදිංචි එච්. ඒ. සීලවතී මහත්මියගෙන් ලැබුණු 2020.10.06 දිනැති පෙත්සම;

(ii) බණ්ඩාරකොස්වත්ත, හලාවත පාර, අංක 248/1 දරන ස්ථානයෙහි පදිංචි ඩබ්ලිව්. ඒ. සුබසිංහ වීරක්කොඩි මහතාගෙන් ලැබුණු 2020.11.10 දිනැති පෙත්සම;

(iii) කොහිලේගෙදර, ඉහළනාකලගමුව, අංක 828/2 දරන ස්ථානයෙහි පදිංචි ආර්. එම්. කේ. එස්. සෙනවිරත්න මහතාගෙන් ලැබුණු 2020.09.01 දිනැති පෙත්සම; සහ

(iv) මහව, කෝන්වැව, කොහොඹකඩල යන ලිපිනයෙහි පදිංචි ඩබ්ලිව්. එම්. තිලකරත්න මහතාගෙන් ලැබුණු 2020.09.21 දිනැති පෙත්සම

ගරු දයාසිරි ජයසේකර මහතා විසින් පිළිගන්වන ලදී.

(4) පිටබැද්දර, දෙහිගස්ප, "මලීෂ" යන ලිපිනයෙහි පදිංචි ආර්. වී. බන්දුල මහතාගෙන් ලැබුණු 2020.11.11 දිනැති පෙත්සම ගරු නිමල් ලාන්සා මහතා විසින් පිළිගන්වන ලදී.

(5) වැලිගල්ල, කොටකේදෙණිය පාර, අංක 130 දරන ස්ථානයෙහි පදිංචි අරඹේ ගෙදර සංජීව රවීන්ද්‍ර රාජපක්ෂ මහතාගෙන් ලැබුණු 2020.08.21 දිනැති පෙත්සම ගරු අනුරාධ ජයරත්න මහතා විසින් පිළිගන්වන ලදී.

(6) වක්වැල්ල, හපුගල, මවුන්ට් ප්ලසන්ට්, පීල්ල පාර, අංක 31ඒ දරන ස්ථානයෙහි පදිංචි ටී. කේ. ජයසුන්දර මහතාගෙන් ලැබුණු 2020.10.13 දිනැති පෙත්සම ගරු විජිත හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

(7) මිරිස්ස, උඩුපිල, "කෙත්සිරි" යන ලිපිනයෙහි පදිංචි ඒ. පී. කවේනිස් මහතාගෙන් ලැබුණු 2021.01.21 දිනැති පෙත්සම ගරු බුද්ධික පතිරණ මහතා විසින් පිළිගන්වන ලදී.

(8) (i) කොලොන්නාව, කොළොන්නාව පාර, රජයේ නිවාස, අංක 9/2 දරන ස්ථානයෙහි පදිංචි අජන්ත රුවන්පතිරණ මහතාගෙන් ලැබුණු 2021.01.11 දිනැති පෙත්සම;

(ii) පිළියන්දල, කැස්බෑව, ඉසුරුපුර, අංක 14/3 දරන ස්ථානයෙහි පදිංචි එල්. පී. ජයසුන්දර මහතාගෙන් ලැබුණු 2021.01.25 දිනැති පෙත්සම; සහ

(iii) ගොතටුව, මානිගමුල්ල පාර, අංක 279/බී දරන ස්ථානයෙහි පදිංචි පී. වී. එස්. ප්‍රියංකර පෙරේරා මහතාගෙන් ලැබුණු 2020.09.08 දිනැති පෙත්සම

ගරු එස්. එම්. මරික්කාර් මහතා විසින් පිළිගන්වන ලදී.

(9) අගලවත්ත, "ස්කූල් වීව්" යන ලිපිනයෙහි පදිංචි එච්. ජී. රේණුකා දීපානි මහත්මියගෙන් ලැබුණු 2021.01.11 දිනැති පෙත්සම ගරු සංජීව එදිරිමාන්න මහතා විසින් පිළිගන්වන ලදී.

(10) (i) පේරාදෙණිය, උඩර්රියගම, ප්‍රගති මාවත, අංක 35/බී/2 දරන ස්ථානයෙහි පදිංචි එම්. කේ. බී. හේරත් මහතාගෙන් ලැබුණු 2020.10.16 දිනැති පෙත්සම;

(ii) පුස්සැල්ලාව, ඉහළගම, "කෙත්සිරි" යන ලිපිනයෙහි පදිංචි ඕ. ජී. අනුෂා උදයංගනී කුමාරි මහත්මියගෙන් ලැබුණු 2020.12.07 දිනැති පෙත්සම; සහ

(iii) ඉහළ කොබ්බෑකඩුව, කොබ්බෑකඩුව, අංක 62/A දරන ස්ථානයෙහි පදිංචි ටී. එම්. රත්නායක මහතාගෙන් ලැබුණු 2020.10.24 දිනැති පෙත්සම

ගරු වසන්ත යාපාබණ්ඩාර මහතා විසින් පිළිගන්වන ලදී.

(11) වේයන්ගොඩ, බණ්ඩාරනායක පාර, අංක 536/2 දරන ස්ථානයෙහි පදිංචි එම්. පී. ලලිත් පද්මසිරි මහතාගෙන් ලැබුණු 2021.02.10 දිනැති පෙත්සම ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් පිළිගන්වන ලදී.

(12) මාකෙවිට, වැලිකඩ, අංක 151 දරන ස්ථානයෙහි පදිංචි එන්. ඒ. එම්. සී. ප්‍රියන්ත කුමාර මහතාගෙන් ලැබුණු 2020.09.25 දිනැති පෙත්සම ගරු එම්. ඩබ්ලිව්. ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා විසින් පිළිගන්වන ලදී.

(13) කුලියාපිටිය, මීනෑව - ඉළුක්හේන, "හේරත් පාය" යන ලිපිනයෙහි පදිංචි එච්. එම්. සරත් ගාමිණී හේරත් මහතාගෙන් ලැබුණු 2021.01.15 දිනැති පෙත්සම ගරු සමන්ප්‍රිය හේරත් මහතා විසින් පිළිගන්වන ලදී.

30 (10) දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගය යටතේ එම පෙත්සම්, මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට යොමු කරන ලදී.

**4. පාර්ලිමේන්තුවේ රැස්වීම් :** පාර්ලිමේන්තුවේ සභානායකවරයා ඉදිරිපත් කළ යෝජනාව,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල සහ 2020 ඔක්තෝබර් 06 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, අද දින රැස්වීම් පැවැත්වෙන කාල වේලාව පූ.භා. 10.00 සිට අ.භා. 12.30 දක්වා ද, අ.භා.1.30 සිට අ.භා.5.30 දක්වා ද විය යුතු ය. අ.භා. 3.30ට පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8(5) ක්‍රියාත්මක විය යුතු ය. අ.භා. 5.30ට කථානායකතුමා ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තැබිය යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**5. ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත යටතේ නියෝග:** කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී. ඊට අදාළ ප්‍රශ්නය (2021 පෙබරවාරි 23),— "1993 අංක 50 දරන ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනතේ 15 වගන්තිය සමඟ කියවිය යුතු, 53 වගන්තිය යටතේ මැණික් සහ ස්වර්ණාභරණ බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් කර්මාන්ත සහ සැපයුම් කළමනාකරණ අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020

මාර්තු 02 දිනැති අංක 2165/2 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදින්, විවාදය තවදුරටත් පවත්වන ලදී.

(පූ.භා. 11.38 ට නියෝජ්‍ය කථානායකවරයා මූලාසනාරූඪ විය.)

"ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ විය යුතු ය"යි ගරු ලලිත් එල්ලාවල මහතා, ගරු (ආචාර්ය) වී. රාධක්‍රිෂ්ණන් මහතා ස්ථිර කරමින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 1.30 ට ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය මූලාසනාරූඪ වූවා ය.)

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**6. විදේශ විනිමය පනත යටතේ නියෝග:** අග්‍රාමාත්‍ය සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යවරයා වෙනුවෙන් වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වගන්තිය සමඟ කියවිය යුතු 29 වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.23 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**7. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 1):** වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 28 දිනැති අංක 2199/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**8. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2):** වෙළඳ අමාත්‍යවරයා ඉදිරිපත් කළ යෝජනාව,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියෝගය (අංක 2),— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වගන්තිය යටතේ සෙස් බදු සම්බන්ධයෙන් වෙළඳ අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2020 ඔක්තෝබර් 29 දිනැති අංක 2199/21 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2021.02.09 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**9. ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම් වී කරනු ලබන වෙනස්කම් සහ කාන්තාවන්ගේ අයිතිවාසිකම් කඩවීම් පිළිබඳව විශේෂ අවධානය යොමු කරමින්, ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය තහවුරු කිරීමට සහ ඒ පිළිබඳව සොයා බලා සිය නිර්දේශ පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වූ පාර්ලිමේන්තු විශේෂ කාරක සභාව:** ප්‍රාථමික සෞඛ්‍ය සේවා, වසංගත රෝග හා කොවිඩ් රෝග පාලන කටයුතු රාජ්‍ය අමාත්‍යවරිය ඉදිරිපත් කළ යෝජනාව,— නීතිය ඉදිරියේදී සියලුම පුද්ගලයන් එක සමාන වන බව සහ සියලුම පුද්ගලයන්ට නීතියේ සමාන ආරක්ෂාව හිමිවන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ 12 ව්‍යවස්ථාව මඟින් පිළිගෙන තිබෙන හෙයින් ද;

කාන්තා අයිතිවාසිකම්වල ප්‍රගතිය උදෙසා වෙනස්කම්වලට ලක්වූවන් සම්බන්ධයෙන් හිතකර ව්‍යවස්ථාදායක හෝ විධායක ක්‍රියාමාර්ග ගැනීම සඳහා 12(4) ව්‍යවස්ථාව මඟින් විධිවිධාන සලසා ඇති හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, මානව හිමිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය (UDHR); සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICCPR); ආර්ථික, සමාජීය සහ සංස්කෘතිකමය අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය (ICESCR); සහ කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම්වලට එරෙහි සම්මුතිය (CEDAW) වැනි සමානාත්මතාවය ප්‍රවර්ධනය කරනු ලබන ජාත්‍යන්තර නෛතික සාධනපත්‍ර ගණනාවක් අපරානුමත කර ඇති හෙයින් ද;

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කර ගෙන ඇති, ශ්‍රී ලංකාව ද අත්සන්කාර පාර්ශ්වයක් වන, තිරසර සංවර්ධන ඉලක්ක සන්දර්භය තුළ ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය සහතික කිරීම සහ සියලුම කාන්තාවන් සහ දැරිවියන් සවිබල ගැන්වීම වැදගත් වී ඇති හෙයින් ද;

ගරු (වෛද්‍ය) සුදර්ශිනී ප්‍රනාන්දුපුල්ලේ මහත්මියගේ සභාපතිත්වයෙන් යුත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදය විසින් ඔවුන්ගේ නියෝජන, නීතිකරණ, අයවැයකරණ සහ අධීක්ෂණ කාර්යයන් හරහා ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය වෙනුවෙන් පෙනී සිටීමට සහ ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සඳහා යාන්ත්‍රණයක් සකස් කිරීමේ අවශ්‍යතාවය සම්මත කර ගෙන ඇති හෙයින් ද; සහ

ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය ප්‍රවර්ධනය කරමින් එයට ගරු කරනු ලබන බව සහ ශ්‍රී ලංකාව තුළ සියලුම කාන්තාවන් සහ දැරිවියන් සවිබල ගන්වනු ලබන බව සහතික කරමින් ද, ස්ත්‍රී-පුරුෂ සමාජභාවය මත පදනම්ව කරනු ලබන වෙනස්කොට සැලකීම්වලට ලක්වූ අයගේ නොවිසඳී ඇති ගැටලුවලට පිළියම් සෙවීම සඳහා පහත කරුණු සම්බන්ධයෙන් සොයා බලා ඒ පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීම පිණිස පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් පත් කළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මතකර සිටියි: —

(අ) රැකියා, උසස්වීම් අවස්ථා සහ සේවා ස්ථානයේදී සිදු වන හිංසනයන් ඇතුළුව ස්ත්‍රී - පුරුෂ සමාජභාවය මත පදනම්ව කරනු ලබන සියලු ආකාරයේ වෙනස්කොට සැලකීම් පිළිබඳ කාන්තාවන්ගේ දුක්ගැනවිලි විභාග කර බැලීම;

(ආ) සියලු ම අංශවලට සහ සියලු ම මට්ටම්වලට ප්‍රමාණවත් අභ්‍යන්තර සම්පත් වෙන් කර දීම සහ ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය වැඩිදියුණු කිරීම සඳහා ඇති ප්‍රවේශය සමාලෝචනය කිරීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම;

(ඇ) වෙනස්කොට සලකනු ලැබීම සහ කාන්තාවන්ගේ සහ දැරිවියන්ගේ ජීවිත කෙරෙහි ඇති වන ඍණාත්මක බලපෑම වැළැක්වීම පිණිස ස්ත්‍රී-පුරුෂ සමාජභාවය ප්‍රධාන ප්‍රවාහයට ගෙන ඒම සහතික කරමින් අදාළ නීති පරීක්ෂා කර බැලීම සහ සමාලෝචනය කිරීම;

(ඈ) ස්ත්‍රී-පුරුෂ සමාජභාවය අරමුණු කර ගත් සැලසුම් සකස් කිරීම සහ මූල්‍ය සම්පාදනය සහතික කරලනු පිණිස අදාළ රේඛීය අමාත්‍යාංශ සහ අධිකාරීන් දිරිමත් කිරීම;

(ඉ) පිරිමින් සහ කාන්තාවන් අතර සමානාත්මතාවය සාක්ෂාත් කර ගැනීමට අදාළ වන කරුණු පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ තොරතුරු ප්‍රචාරණය කිරීම දිරිමත් කිරීම;

(ඊ) ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටමේ සහ රාජ්‍ය, සිවිල් සමාජ සහ පෞද්ගලික අංශවල තීරණ ගැනීමේ කණ්ඩායම් තුළ, වැඩි කාන්තා නියෝජනයක් ඇති කිරීම සඳහා පෙළඹවීම සහ ඒ වෙනුවෙන් පෙනී සිටීම;

(උ) ජාතික, පළාත් සහ ප්‍රාදේශීය මට්ටම්වලදී ස්ත්‍රී-පුරුෂ සමාජභාවය පිළිබඳ මූලධර්ම සංකලනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම;

(ඌ) ශ්‍රී ලංකාව තුළ ස්ත්‍රී-පුරුෂ සමතාව සහ සමානාත්මතාවය වැඩිදියුණු කිරීම සඳහා රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරීත්වයන් දිරිමත් කිරීම;

(එ) කලාපීය සහ ජාත්‍යන්තර මට්ටමෙන් රටවල් අතර විශේෂඥ දැනුම සහ අත්දැකීම් බෙදා ගැනීම සහ අනෙකුත් රටවල පාර්ලිමේන්තුවලින් උගත් පාඩම් සමාලෝචනය කිරීම; සහ

(ඒ) ඉහත සඳහන් කරුණු හා සම්බන්ධ හෝ එම කරුණුවලට ආනුෂංගික සියලු කාරණා පිළිබඳ සළකා බැලීම.

2. (අ) එකී කාරක සභාව සහ එහි සභාපතිවරයා කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 101 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, කාරක සභාව, පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ සංසදයේ සියලුම සාමාජිකාවන් සහ සියලුම දේශපාලන පක්ෂ නියෝජනය කරන වෙනත් මන්ත්‍රීවරයන් ද ඇතුළත්ව සාමාජිකයන් විසිපහකට (25) නොවැඩි සංඛ්‍යාවකින් සමන්විත යුතු ය.

3. එම කාරක සභාවට —

(අ) සිය ගණපූරණය නියම කර ගැනීමට ද;

(ආ) ඉහත සඳහන් කර ඇති කරුණු පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා කාරක සභාව විසින් අවශ්‍ය යැයි තීරණය කරනු ලබන පරිදි, ඕනෑම පුද්ගලයෙකු එම කාරක සභාව ඉදිරියට කැඳවීමට ද, ඕනෑම ලියවිල්ලක් හෝ වාර්තාවක් ලබා දෙන ලෙසට ඕනෑම පුද්ගලයෙකුට නියම කිරීමට ද, එකී සියලු සාක්ෂි, ලිඛිත හෝ වාචිකව, ලබා දීමට හෝ ලබා ගැනීමට ද;

(ඇ) කාරක සභාවට සහාය වීම පිණිස අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගේ සහ ප්‍රවීණයන්ගේ සේවය ලබා ගැනීමට ද; සහ

(ඈ) කලින් කල අන්තර්වාර වාර්තා ඉදිරිපත් කිරීමට ද, පාර්ලිමේන්තුව කල් තබන ලද්දේ වුවද රැස්වීම් පවත්වා ගෙන යාමට ද

බලය තිබිය යුතුය.

4. සිය පළමු රැස්වීම් දිනයේ සිට එක් වසරක කාලයක් තුළ හෝ පාර්ලිමේන්තුව විසින් ලබාදෙන අන් කවර හෝ අමතර කාලසීමාවක් තුළ හෝ කාරක සභාව විසින් සිය වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

5. කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීමෙන් අනතුරුව එම වාර්තාව අදාළ විෂය භාර අමාත්‍යවරයන් වෙත යොමු කරනු ලැබිය යුතු අතර, ඒ සම්බන්ධයෙන් සිය නිරීක්ෂණ සහ ගන්නා ලද පියවර සති අටක (08) කාල සීමාවක් ඇතුළත දී, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේ ය.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

**10. කල් තැබීම (ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුති අංක 190 බලාත්මක කර කාන්තාවන් සවිබලගැන්වීම) :** මෙම පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතු ය''යි මහාමාර්ග අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදින්, විවාද විය.

"ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා මූලාසනාරූඪ විය යුතු ය"යි කාන්තා හා ළමා සංවර්ධන, පෙර පාසල් හා ප්‍රාථමික අධ්‍යාපන, පාසල් යටිතල පහසුකම් හා අධ්‍යාපන සේවා රාජ්‍ය අමාත්‍යවරයා විසින් යෝජනා කරන ලදී.

ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.

(අ.භා. 3.52 ට ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා මූලාසනාරූඪ විය.)

එකල්හි වේලාව අ. භා. 5.30 වූයෙන්, මූලාසනාරූඪ මන්ත්‍රීවරයා විසින්, අද දින සභා සම්මතිය අනුව ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.

පාර්ලිමේන්තුව ඊට අනුකූලව, 2021 මාර්තු 10 බදාදා පූ. භා. 10.00 වන තෙක් කල් ගියේය.